### ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## (01) සංවර්ධන නිලධාරී (පුරප්පාඩු 02)

**i. රැකියා විස්තරය**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2013 අංක 33 දරන පනතින් සම්මත කර ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට දායක වීම, ඉහත තනතුරුවලට අදාළ රාජකාරී කටයුතු ඉටු කිරීම, එදිනෙදා පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා පරිපාලනයට සහාය වීම හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරී.

**ii. සුදුසුකම්**

කළමණාකරණය, ගණකාධිකරණය, වාණිජවේදී, සංඛ්‍යානය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබිය යුතුය.

**iii. වැටුප් පරිමාණය**

MA-3-2016 (රු. 32,200/- -10X445-11X660-10X730-5X750 - රු. 54,960/-)

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 02/2016 අනුව)

**iv. වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**v. බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

## (02) තාක්ෂණ සහකාර (පුරප්පාඩු 01)

**i. රැකියා විස්තරය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන ගොඩනැගිල්ල යහපැවැත්මෙන් පවත්වාගෙන යාමට දායක වීම, නියෝජ්‍යායතනයේ ගොඩනැගිලි පරිශ්‍රය යථා පරිදි පවත්වාගැනීමට අවශ්‍ය අලුත්වැඩියා සහ නඩත්තු පිළිබඳ නිරන්තරයෙන් විමර්ශනය කිරීම හා ඒවා පිළිබඳ පාලන අංශය දැනුවත් කිරීම, අවශ්‍ය වන්නා වූ නඩත්තු හා අලුත්වැඩියා නිසිකලට හඳුනාගැනීමටත් ඒවා පිළිසකර කිරීමට යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම, අවශ්‍ය පරිදි එම නඩත්තු කටයුතු කිරීමට දායක වීම, තාක්ෂණ සහකාර හට තනිව සිදුකළ නොහැකි අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා යෝග්‍ය පරිදි බාහිරව එම පිළිසකර කරන ආයතන මගින් මිල විමසුම් ලබාගැනීමටත් ඒවායේ ගුණාත්මකභාවය හා මිල ගණන් සැසඳීමටත් අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම, ඉදිකිරීම් මිනුම් ගැනීම හා බිල්පත් පරීක්ෂා කිරීම.

**ii. සුදුසුකම්**

**(අ) බාහිර අයදුම්කරුවන්**

ජාතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය තාක්ෂණ පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමින ඉදිකිරීම් තාක්ෂණය හෝ ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**iii. වැටුප් පරිමාණය**

MA-2-1-2016 (රු. 30,310-10X300-7X350-4X495-20X660 - රු. 50,940/-)

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 02/2016 අනුව)

**iv. වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**v. බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

## ● පොදු කොන්දේසි

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

## ● අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

(අපේක්ෂකයන් විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථ සාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත.)

❖ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම කරනු ලැබේ.

## ● අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය

අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතිකවල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමඟ තම ජීව දත්ත තොරතුරු **2020-10-16** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363/12, සුගතදාස ස්ටේඩියම් - බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

❖ එසේ නොවන සහ අයදුම්පත් භාර ගන්නා දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

❖ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

❖ අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

❖ මේ පිළිබඳව බලපෑම් කිරීම් නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**

Source: Dinamina, Daily News (2020.10.02)